# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය

## අධ්‍යයන කාර්යය මණ්ඩල පුරප්පාඩු පිරවීම.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් අදාළ සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් තනතුරු සඳහා 2016-11-15 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය**

- මෘදුකාංග සංවර්ධනය පිළිබඳ කථිකාචාර්ය (ආධුනික)/ තාවකාලික කථිකාචාර්ය තනතුර.

**02. මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය.**

- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ කථිකාචාර්ය (ආධුනික)/ තාවකාලික කථිකාචාර්ය තනතුර.

**03. දේපළ කළමනාකරණ අධ්‍යයනාංශය.**

- දේපළ කළමනාකරණ හා තක්සේරුකරණය පිළිබඳ කථිකාචාර්ය (ආධුනික)/තාවකාලික කථිකාචාර්ය තනතුර.

**04. මූල්‍ය අධ්‍යයනාංශය.**

- මූල්‍ය කළමනාකරණ විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය (ආධුනික)/ තාවකාලික කථිකාචාර්ය තනතුර.

**05. ව්‍යාපාර සන්නිවේදන ඒකකය**

- ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ කථිකාචාර්ය (ආධුනික)/ තාවකාලික කථිකාචාර්ය තනතුර.

**06. උපදේශක (පරිගණක තාක්ෂණ) II ශ්‍රේණිය.**

### වැටුප් පරිමාණය.

➢ **කථිකාචාර්ය (ආධුනික)**

රු.27,775-10x645-34,225 p.m. (U-AC3(IV))

➢ **තාවකාලික කථිකාචාර්ය**

රු. 26,020/- (ස්ථාවර)

➢ **උපදේශක (පරිගණක තාක්ෂණ) II ශ්‍රේණි**

රු.26,020-3x645-27,955(EB)28,600-14x645-37,630p.m. (U-AS2(II))

මීට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත දීමනාවන් ගෙවනු ලැබේ. ඒ අනුව,

➢ **කථිකාචාර්ය (ආධුනික)**

ආසන්න දළ වැටුප රු. 84,460/-

(එමෙන්ම මූලික වැටුපෙන් 35% ක ප්‍රමාණයක් 'පර්යේෂණ දීමනා' ලෙස පර්යේෂණයක් කිරීමට යටත්ව ගෙවනු ලැබේ.)

➢ තාවකාලික කථිකාචාර්ය

ආසන්න දළ වැටුප රු. 49,024/-

➢ උපදේශක (පරිගණක තාක්ෂණ) II ශ්‍රේණිය

ආසන්න දළ වැටුප රු. 59,432/-

**ප්‍රතිලාභ :**

➢ කථිකාචාර්ය (ආධුනික)/ උපදේශක (පරිගණක තාක්ෂණ) II ශ්‍රේණිය තනතුරු සඳහා,

❖ මාසික ඉපැයීම්වලින් 10% ක් අර්ථසාධක අරමුදලට බැර වන අතර, විශ්වවිද්‍යාලය විසින් එම තනතුරු ලාභීන්ගේ මාසික ඉපැයීම්වලින් 15% ක් (විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදල සඳහා 7% ක් හා විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සඳහා 8%ක්) හා 3% ක් සේවා නියුක්ති භාරකාර අරමුදලට බැර කරනු ලැබේ.

❖ තාවකාලික කථිකාචාර්ය තනතුර සඳහා,

❖ මාසික ඉපැයීම්වලින් 10% ක් අර්ථසාධක අරමුදලට බැර වන අතර, විශ්වවිද්‍යාලය විසින් එම තනතුරු ලාභීන්ගේ මාසික ඉපැයීම්වලින් 15% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට හා 3% ක් සේවා නියුක්ති භාරකාර අරමුදලට බැර කරනු ලැබේ.

### අයදුම්පත් හා අයදුම් කිරීමේ ක්‍රමය.

ඉහත තනතුරු සඳහා විශ්වවිද්‍යාලයේ අධ්‍යයන ආයතන අංශයෙන් ලබා ගත් අයදුම්පත් මගින් අයදුම් කළ යුතුය. අයදුම්පත, අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් විස්තර තැපැල් මගින් ලබා ගැනීමට ස්වකීය ලිපිනය හා අයදුම් කරන තනතුර සඳහන් කර මුද්දර සහිත සෙ.මී. 25.5 x සෙ.මී.10 ලිපි කවරයක් නියෝජ්‍ය ලේඛකාධිකාරී/ අධ්‍යයන ආයතන වෙත ආවරණ ලිපියක් සහිතව එවීමෙන් හෝ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල නිල වෙබ් (www.sjp.ac.lk) අඩවියෙන් බාගත කර ගැනීමෙන් ලබාගත හැක. අයදුම්පත් නිකුත් කිරීමේ අවසන් දිනය 2016-11-10 වේ.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපැල් මගින් නියෝජ්‍ය ලේඛකාධිකාරී/ අධ්‍යයන ආයතනය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට 2016-11-15 දිනට ප්‍රථම එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

විශ්වවිද්‍යාල ක්ෂේත්‍රය/ රාජ්‍ය සේවය/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයෙහි නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.

අපේක්ෂකයන්ගේ ලුහුඬු ලැයිස්තු සැකසුම විශ්වවිද්‍යාලය සතු වේ. මෙම අවශ්‍යතාවයන්ට අනුකූල නොවන, අසම්පූර්ණ සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේඛකාධිකාරී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ.**